ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2422/50 - 2025 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2025.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

අමිත පැස්කුවල් මයා, අංක 61, අලුත්ගම පාර, මතුගම.

*සහ*

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදුව, ලියනගෙමුල්ල, එච්පීටී ප්‍රධාන පාර, අංක 31/1, නීතිඥ සී.ජී.එච්.එම්. විජේරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,
කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අමිත පැස්කුවල් මයා, අංක 61, අලුත්ගම පාර, මතුගම.

*සහ*

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරි (සේවා) තනතුරේ සේවය කරනු ලබන අමිත පැස්කුවල් මහතාට සහකාර සාමාන්‍යාධිකාරි (සේවා) තනතුරට අදාළව මූලික වැටුප ලෙස රු.33,705/- ක මුදල හිමි ද, හිමිනම් එය නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද ? යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0074

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.